www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මූල්‍ය ප්‍රාග්ධනය හා ග්‍රීක නය අර්බුදය

## Finance capital and the Greek debt crisis

2010 මාර්තු 06

1929 දී එක්සත් ජනපදයේ තොග වෙලඳපොල බිඳ වැටීමෙන් පසුව, ලෝක ධනවාදයට පහර දුන් අතිශය බරපතල මූල්‍ය අර්බුදය හමුවේ, ඊට වගකිවයුතු බැංකු හා මූල්‍යායතනවල කටයුතු පාලනය කිරීම සඳහා එකදු බැරෑරුම් පියවරක් හෝ ගෙන නැත.

*ෆිනෑන්ෂල් ටයිම්ස්හි* පලවූ මෑත ලිපියක් තුල, මාධ්‍යවේදී ලූකස් සෙයිසී මෙසේ ලිවීය. "දේපල හා මූල්‍ය අර්බුදය පුපුරා යාමේ තැන් පටන් මේ දක්වා දෙවසරක් ගතවී ඇතත්, බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ නියාමන ක්‍රියාවලිය තුල කිසිදු ප්‍රගතියක් ඇතිවී නැත. වඩාත්ම නරක කාරනය වන්නේ, ඒ සඳහා බැරෑරුම් ආරම්භකත්වයක් හෝ ගෙන නොතිබීමයි. මෙම රෝග විනිශ්චය එක්සත් ජනපදයට මෙන්ම යුරෝපා සංගමයට හා ජාත්‍යන්තර නියාමනයේ මට්ටම පිලිබඳව ද එකසේ වලංගු වෙයි."

මූල්‍ය වෙලඳපොලවල් නියාමනය කිරීමේ දී, ලෝකය පුරාම ආන්ඩු පෙන්වා ඇති අසාර්ථකත්වයෙන් ප්‍රකාශිත වන්නේ, ආන්ඩුවල ප්‍රතිපත්ති තීරනය කිරීමේ දී ප්‍රධාන බැංකු කෙතරම් නම් අධිකාරයක් දරන්නේ ද යන්නයි. එංගලන්ත බැංකුව ඉදිරිපත් කල විශ්ලේශනයකට අනුව, එක්සත් ජනපදයේ ද මහා බ්‍රිතාන්‍යයේ හා යුරෝපා කලාපයේ ද බැංකුවලට මුක්කුව දීමේදී, ඒවායේ රාජ්‍ය දායකත්වය, සමස්තයක් ලෙස ඩොලර් ට්‍රිලියන 14 ක අගයක් දරයි. එම අගය, ලෝක දල දේශීය නිශ්පාදිතයෙන් (දදේනි) හතරෙන් එකකට සමානවේ.

එක්සත් ජනපදය ගත් මූලිකත්වයෙන් පසුව, ලෝකය පුරාම ආන්ඩු ප්‍රකාශ කලේ, පෙර නොවූ විරූ ආකාරයේ එවන් පියවර ගැනීමට සිදුවූයේ "ප්‍රධාන බැංකු අසාර්ථත වීමට තරම් ලොකු වැඩි නිසා" බවය. මෙසේ බැංකු වලට ඇප දීමේ ප්‍රතිපලය වූයේ, ලෝකයේ ප්‍රමුඛතම මූල්‍ය හිමිකරුවන්ගේ ආර්ථික හා දේශපාලන බලය තවත් ශක්තිමත් වීම පමනි.

ප්‍රධාන බැංකුවලට දාදු මේසය කරා යලි පැමිනීමට හැකිවී ඇත්තේ, අනාගතයේදී ආන්ඩු විසින් තම අලාභය ඌනපූරනය කරනු ඇතැයි යන්න පිලිබඳව ඇති දැඩි විශ්වාසය නිසාය. මේ තත්වය සමපේක්ෂනයේ අතිශයින්ම අන්තරායකාරී ආකෘතීන් තුල ඔවුන්ගේ මැදිහත්වීම වේගවත් කරන්නට ඔවුන් මෙහෙයවා තිබේ.

බිංදුවට ආසන්න පොලී අනුපාතයන් මත පදනම් වෙමින්, පොලියක් නැතිව ම වාගේ මුදල් නයට ගෙන, වානිජ්‍ය ගනුදෙනු කරුවන්ට දෙන නය සඳහා සියයට 5 හෝ 6 ක පොලියක් අයකර ගැනීමට මූල්‍යායතනවලට අවස්ථාව හිමිව තිබේ. ප්‍රතිපලය වී ඇත්තේ, ලාභ හා පාරිතෝෂික දීමනා වේගයෙන් ඉහල යෑමයි. සමහර අවස්ථාවල දී ඒවා 2008 වසරේ අර්බුදය පැනනැඟීමට ආසන්නයේ පැවතුනාටත් වඩා වේගවත් ය.

ආන්ඩුවල මුදල් පරිත්‍යාගය, සියලු වර්ගයේ සමපේක්ෂන ආයෝජනයන්හි බැංකු කටයුතු, ආවේශ ගන්වා ඇත. ලේමන් බ්‍රදර්ස්, බෙයා ස්ටියර්න්ස්, ඇමරිකන් ඉන්ටර්නැෂනල් ගෲප් (ඒඅයිජී) බංකොලොත් භාවයට ඇද දැමීමේලා මුඛ්‍ය භූමිකාවක් ඉටු කල ව්‍යුත්පන්නයන් හා නය සුරැකුම් රක්ෂනයේ (සීඩීඑස්) අතිශය සමපේක්ෂනාත්මක ආකෘතීන් ගනුදෙනු කිරීම බෙහෙවින් ප්‍රචලිතව තිබේ.

සමාගමක් වුවත් නැතත්, සමහරවිට රටක්ම වුවත්, නය පැහැර හැරීමට ඉඩ ඇතැයි යන්න මත ඔට්ටු තැබීම සඳහා ආරක්ෂිත අරමුදල් හා බැංකු වලට අවසර ලැබෙන රක්ෂන කටයුතු වැනි කොන්ත්‍රාත්, නය සුරැකුම් රක්ෂනය යනුවෙන් හඳුන්වයි. නියාමනය නොකරන සීඩීඑස් වෙලඳාම යනු, සමාගම් හෝ රටවල් බංකොලොත් භාවයට ඇද දැමීමෙන් සීඩීඑස් සමපේක්ෂකයන්ට ප්‍රතිලාභ හිමිවන වර්ගයේ ගනුදෙනු ක්‍රමයකි. එක් විශ්ලේෂකයෙකුට අනුව, "එය වනාහි ඔබගේ යාබද නිවස වෙනුවෙන් රක්ෂනයක් ලබා ගනිමින් ඔබ, එම නිවස පුලුස්සා දැමීම මගින් ප්‍රතිලාභ ලැබීමට හැකි තත්වයක් නිර්මානය කරනවා වැනිය."

ග්‍රීක රාජ්‍යයේ මූල්‍ය අර්බුදය සම්බන්ධිතව සලකන කල, සීඩීඑස් වෙලඳමේ ක්‍රියාකලාපය කැපී පෙනෙයි. කුනුවී යන මල කුනකට ඇදී එන උකුස්සන් මෙන් ප්‍රධාන බැංකු හා ආරක්ෂිත අරමුදල්වල සීඩීඑස් වෙලෙන්දෝ අධික නය බරින් පෙලෙන ග්‍රීක ආර්ථිකය කරා ඇදී ආහ. ඉතිරි කිරීමේ භාරකාර අරමුදල හා නිෂ්කාශන සංස්ථාවට අනුව, නය සුරැකුම් රක්ෂන වෙලඳම පසුගිය වසරේ ග්‍රීක නය බර ඉහල යාමට දායකවී තිබේ.

ග්‍රීක නය වෙනුවෙන් වූ සමස්ත රක්ෂනයේ අගය මෙම වසරේ පෙබරවාරි වන විට ඩොලර් බිලියන 85 දක්වා වැඩිවිය. වසරකට පෙර එම සංඛ්‍යාව පැවතුනේ බිලියන 38 ක මට්ටමේ ය. එම වර්ගයේ වෙලඳමෙහි ඉහල නැගිම, අවිචල්‍ය ලෙස ග්‍රීක නය රක්ෂනයේ පිරිවැය වැඩිකර තිබේ. ජනවාරි මුල් කාලය සමඟ සසඳන කල ග්‍රීක බැඳුම්කර රක්ෂනයේ පිරිවැය දෙගුනයකින් තරම් වැඩිවී ඇත. මෙය අනෙක් අතට, රටේ අයවැය තත්වය පිරිහෙලා, සීඩීඑස් සමපේක්ෂන මිනී කාක්කන්ට පාරාදීසයක් වන්, නය පැහැර හැරීමේ අවතාරය ලඟටම ගෙන ආවේය.

සීඩීඑස් සමපේක්ෂකයන්ගේ කටයුතු ග්‍රීසියට පමනක් සීමාවී නැත. පසුගිය සති කිහිපය තුල ඔවුහු යුරෝපීය මුදල කෙරෙහි වැඩි වැඩියෙන් බැල්ම හෙලන්නට පටන් ගෙන තිබේ. ඒ, ග්‍රීක ආර්ථිකයේ බිඳ වැටීමක්, යුරෝව කඩා වැටීමට තුඩුදෙනු ඇතැයි යන අපේක්ෂාවෙනි. පසුගිය සතිය තුල ඔවුන්, බ්‍රිතාන්‍ය රාජ්‍ය නයගැතිභාවයේ වත්මන් මට්ටම සැබවින්ම ග්‍රීසිය ඉක්මවා තිබීමේ කාරනය මත පදනම් වෙමින්, බ්‍රිතාන්‍ය පවුමට එරෙහිව ඔට්ටු ඇල්ලීම ද වැඩිකර ඇත.

ව්‍යුත්පන්න හා නය සුරැකුම් රක්ෂන වෙලඳමේ යෙදී සිටින්නන්ගේ ලැයිස්තුව මුලටම ඇත්තේ, ජේපී මෝගන් චේස්, සිටිබෑන්ක්, බෑන්ක් ඔෆ් ඇමරිකා හා ගෝල්ඩ්මන් සැක්ස් වැනි ඇමරිකානු බැංකු ය. මූල්‍ය පරිපාලකයාගේ කාර්යාලයට අනුව, 2009 තෙවෙනි කාර්තුව අවසානයේ නය ව්‍යුත්පන්නයන්ගේ කාල්පනික අගයෙන් ඩොලර් ට්‍රිලියන 13 ක සමස්ත වටිනාකමක් එක්සත් ජනපද බැංකු විසින් හිමිකරගෙන සිටියි.

කෙසේ වෙතත් එම වෙලඳමේ යෙදී සිටින්නේ එක්සත් ජනපද බැංකු පමනක්ම නොවේ. සුරැකුම් රක්ෂනයේ ලොකුම ගැනුම්කරුවන් අතරට ක්‍රෙඩිට් සුවිස් ග්‍රෘප්, සෝසයිටි ජෙනරාල්, බීඑන්පී පැරිබාස් එස්ඒ හා ඩොයිෂෙ බෑන්ක් වැනි යුරෝපයේ ලොකුම බැංකු ගනනාවක්ම ඇතුලත් වෙයි. ව්‍යුත්පන්න වෙලඳපොලේ ඔවුන්ගේ කටයුතු, ග්‍රීක ආර්ථිකයට ඔවුන්ගේ නිරාවරනය වීම පිලිබිඹු කරයි. ප්‍රන්ස බැංකු ග්‍රීක නයෙන් බිලියන 75.4 ක් ද ස්විස් ආයතන බිලියන 64 ක් ද හිමිකරගෙන සිටින අතර, ජර්මන් බැංකුවල නිරාවරනය වීම බිලියන 43.2 ක් බව ජාත්‍යන්තර සමථ බැංකුව වාර්තා කලේය.

සමපේක්ෂනයේ අතිශයින්ම සූරාකන හා උපද්‍රවකාරී ආකෘතීන් දිරිමත් කරන, ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනය හා ලෝකයේ ආන්ඩු අතර ඇති තරයේම පරපුටු ස්වභාවයක් ගන්නා බැඳීම, එක් මූල්‍ය විශ්ලේෂකයෙක් මෙසේ කැටිකර දැක්වීය. "සමාගම් වලට බදු ගෙවන්නන් සපයන පරිපූර්න පිටුබලය නොවන්නට, කලමනාකරුවන් කාල්පනික සුරැකුම් රක්ෂනයේ ඊලඟ බිලියනය කරා යාමට බෙහෙවින් මැලිවනු ඇත. ඔවුන් සිය උරහිසට උඩින් පිටුපස බලා, 'මෙය අන්තරාදායක වනු ඇතැයි' කීමට පුලුවන."

එසේත් නැත්නම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හිටපු අර්ථශාස්ත්‍රඥ වරයා කිවූ පරිදි, "එක්සත් ජනපද ආන්ඩුව විසින් ප්‍රතිරක්ෂනය කරන ලද ලෝකයේ ලොකුම ආරක්ෂිත අරමුදල බවට පත්ව ඇත්තේ ගෝල්ඩ්මන් සැක්ස් ය."

ආර්ථිකය හා දේශපාලන ජීවිතය එන්ට එන්ටම හිර කරන දඬු අඬුවක් බවට පත්ව තිබෙන ජාත්‍යන්තර බැංකු ක්‍රියාකාරිත්වය තුලින්, අවශ්‍ය දේශපාලන පාඩම් උකහාගත යුතුය.

බැංකුවල ආර්ථික බලයත් සමග ඒවායේ දේශපාලන ග්‍රහනය පොකුරු ගසමින් වැඩී ඇත. මෑත දශකයන් පුරා මෙය සිදුව ඇත්තේ, එක්සත් ජනපදයේ නම් ඩිමොක්‍රටික් මෙන්ම රිපබ්ලිකානු පරිපාලනයන් යටතේත්, යුරෝපයේ නම් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩු යටතේත් ය.

බැංකු කරුවන් හා මූල්‍ය කතිපයාධිකාරීන් සමග මෙතරම් කිට්ටුවෙන් පෙල ගැසුනු ආන්ඩු, එක්සත් ජනපදය තුල නොතිබුනු තරම්ය. තිබුනා නම් ඒ කිහිපයක් පමනි. වානිජ්‍ය බැංකු විසින් සමපේක්ෂන වෙලඳමේ යෙදුනු ආන්තික ආකෘතීන් සඳහා සොරොව්ව විවෘත කරමින්, ග්ලාස් ස්ටීගල් පනත අහෝසි කිරීමේ නියෝගය අත්සන් තැබුවේ ඩිමොක්‍රටික් ජනාධිපති බිල් ක්ලින්ටන් විසිනි.

යුරෝපයේදී නම්, ලංඩන් නගරය මධ්‍යස්ථානය කරගත් මූල්‍ය ප්‍රාග්ධනයේ දේශපාලන අනුහස ඉමහත් ලෙස වර්ධනය වූයේ නව ලේබර් ආන්ඩු යටතේය. ජර්මනියේදී, ජර්මානු බැංකු වලට ව්‍යුත්පන්න වෙලඳපොලවල සිය ගනුදෙනු වැඩිකර ගැනීමට අවසර ලැබුනු පනත සම්මත කලේ කලින් පැවති සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හා හරිත පක්ෂවල සභාග ආන්ඩුව විසින් ය. ග්‍රීසියේදී ඩෝර්ජ් පැපැන්ඩ්‍රියෝගේ සැසොක් ආන්ඩුව මෑතක දී, එරට රාජ්‍ය නය කලමනාකරනය පිනිස හිටපු ගෝල්ඩ්මන් සැක්ස් නිලධාරියෙකු පත්කලේ ය.

එක් පසෙකින් සිය බැංකු සගයන්ගෙන් ලැබුනු තල්ලුව යටතේ යුරෝපයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් ද ඇමරිකාවේ ඩිමොක්‍රැටිකයන් ද බැංකුවල සූදුකෙලියේ පරාදයන්ට දැන් වන්දි ගෙවීම පටවනු ලැබ සිටින කම්කරු පන්තියේ විරෝධය මැඬපැවැත්වීම සඳහා වෘත්තීය සමිති වෙත හැරුනහ.

සමස්ත මුදල් ඒකකයන් හා රාජ්‍යයන්ම අස්ථාවර කිරීමට අමතරව බැංකුවල සමපේක්ෂන කටයුතු, නව මූල්‍ය බුබුලු නිර්මානය කරමින් හා අනාගත මූල්‍ය අර්බුද පුපුරවා හැරීමට තර්ජනය කරමින් 2008 කඩාවැටීමට ඉහලින් ලඹ දෙමින් තිබේ. සමපේක්ෂන ආයෝජන නැඟී එන ආන්තික රූපාකාරයන්ගේ

වර්ධනය, ධනේශ්වර පද්ධතියේම වෛෂයික තර්කනයට අනුකූලය.

ජාත්‍යන්තර මූල්‍ය මාෆියාව හා ආන්ඩුවල ඔවුන්ගේ සහාපරාධකරුවන්ගේ කටයුතුවල ප්‍රතිපලයක් ලෙස මනුෂ්‍ය වර්ගයාට අත්කර දී තිබෙන විනාශය වැලැක්විය හැක්කේ, පුලුල් වැඩ කරන ජනතාවගේ අධීක්ෂනය හා ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතේ ජාත්‍යන්තර බැංකු හා සියලුම ප්‍රමුඛ මූල්‍යායතන සමාජීයකරනය තුලින් පමනි.

**ස්ටෙෆන් ස්ටෙයින්බර්ග්**

© www.wsws.org